# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2411/56 - 2024 නොවැම්බර් මස 22 වැනි සිකුරාදා - 2024.11.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2012 අංක 12 දරන මුදල් පනත**

2012 අංක 12 දරන මුදල් පනතේ විධිවිධාන සමග කියවිය යුතු, 2013 අංක 12 දරන මුදල් පනතේ 12 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම පහත නියෝගය ප්‍රකාශයට පත් කරමි.

අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2024 නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**නියෝගය**

1. මෙම නියෝගය, "**මුදල් පනතේ - 2024 අංක 01 දරන වාණිජ කේන්ද්‍රස්ථාන නියෝගය**" ලෙස හඳුන්වනු ලැබේ.

2. මුදල් පනතේ - 2022 අංක 01 දරන කේන්ද්‍රස්ථාන නියෝගය මගින් සංශෝධිත, මුදල් පනතේ - 2019 අංක 01 දරන වාණිජ කේන්ද්‍රස්ථාන නියෝගවල අංක 2අ දරන නියෝගයට වහාම ඉක්බිතිව පහත නියෝගය ඇතුළත් කිරීම මගින් 2019 දෙසැම්බර් 05 දිනැති අංක 2152/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද මුදල් පනතේ - 2019 අංක 01 දරන වාණිජ කේන්ද්‍රස්ථාන නියෝග මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලබන අතර, එය එහි 2 ආ. නියෝගය ලෙස බලපැවැත්විය යුතු ය.

2ආ. 2019 අංක 01 දරන වාණිජ කේන්ද්‍රස්ථාන නියෝගවල, 2(1)(අ)(i) නියෝගයේ කුමක් සඳහන්ව තිබුණ ද, ලාෆ්ස් ගෑස් පීඑල්සී (M/s Laugfs Gas PLC) හරහා ද්‍රව පෙට්‍රෝලියම් වායු මෙට්‍රික් ටොන් 9,000ක අතිරේක ප්‍රමාණයක් පහත කොන්දේසිවලට යටත්ව, 2024 නොවැම්බර් 22 වැනි දින සිට බලාත්මක වන මාස 03ක කාල සීමාවක් සඳහා (2025 පෙබරවාරි මස 21 වැනි දින දක්වා) දේශීය වෙළඳපොළ වෙත නිකුත් කිරීමට ලාෆ්ස් ටර්මිනල්ස් ලිමිටඩ් (M/s Laugfs Terminals Limited) වෙත මෙයින් අවසර ලබාදෙනු ලැබේ;

(i) කර්මාන්තවල නියුක්ත පාරිභෝගිකයන් සඳහා සිදුකරන සැපයුමට වඩා ගෘහස්ත පාරිභෝගිකයන් සඳහා වන ද්‍රව පෙට්‍රෝලියම් වායු සැපයුම සම්බන්ධයෙන් ප්‍රමුඛතාවය ලබාදීම ලාෆ්ස් ටර්මිනල්ස් ලිමිටඩ් විසින් සහතික කළ යුතු ය;

(ii) ලාෆ්ස් ටර්මිනල්ස් ලිමිටඩ් විසින් එකී මාස 03 ක කාල සීමාව තුළ දී එකී අනුමත මෙට්‍රික් ටොන් 9,000න් ලාෆ්ස් ගෑස් පීඑල්සී වෙත මෙරට වෙළඳපොළ තුළ සිදුකරන මාසික අලෙවිය මෙට්‍රික් ටොන් 3,000 නොඉක්මවිය යුතු ය. එසේ වුව ද, මෙට්‍රික් ටොන් 3,000 ප්‍රමාණය ඉක්මවා, මෙම නියෝගයේ කාර්යය සඳහා සලකනු ලබන මාස 03ක කාල සීමාව තුළ ලාෆ්ස් ටර්මිනල්ස් ලිමිටඩ් විසින් සිදුකරන ද්‍රව පෙට්‍රෝලියම් වායු ප්‍රති-අපනයන ප්‍රමාණයේ පංගුවක් ලෙස දේශීය අලෙවිය සම්බන්ධයෙන් බාධාවක් නොමැත;

(iii) හිඟයකින් තොරව දේශීය වෙළඳපොළහි ද්‍රව පෙට්‍රෝලියම් වායු ඉල්ලුම සපුරාලීම සහ අඛණ්ඩ සැපයුම පවත්වා ගැනීම පිණිස ලාෆ්ස් ගෑස් පීඑල්සී විසින් අවම වශයෙන් ද්‍රව පෙට්‍රෝලියම් වායු මෙට්‍රික් ටොන් 7,500 ක තොගයක් පවත්වාගෙන යා යුතු ය;

(iv) මෙම නියෝගය මගින් ලබාදෙන අතිරේක පංගුව යටතේ ලාෆ්ස් ගෑස් පීඑල්සී විසින් සිය පූර්ව මාසික අලෙවි ප්‍රමාණය නොඉක්මවිය යුතු ය;

(v) 2019 සිට 2024 සැප්තැම්බර් දක්වා වූ කාල සීමාව තුළ සිදුකළ සිය දේශීය අලෙවිය ගැලපුම් කිරීම සඳහා ලාෆ්ස් ටර්මිනල්ස් ලිමිටඩ් විසින් සිය වාර්ෂික ප්‍රති-අපනයන ප්‍රමාණය ඉහළ නැංවිය යුතු ය;

(vi) 2019 අංක 01 දරන වාණිජ කේන්ද්‍රස්ථාන නියෝගවල විධිවිධාන පරිදි, ලාෆ්ස් ටර්මිනල්ස් ලිමිටඩ් විසින් සිය දේශීය අලෙවියට අදාළව සංස්ථාපිත බදු ඇතුළුව සියලුම අදාළ වන බදු ගෙවිය යුතු ය;

(vii) විකල්ප අපනයන වෙළඳපොළවල් සොයා ගැනීම සඳහා දරන ලද ප්‍රයත්නයන් ද ඇතුළුව මෙම රෙගුලාසි බලාත්මක වන දිනයේ සිට මාස දෙකකින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් එකී කටයුතුවල ප්‍රගතිය සමාලෝචනය කළ යුතු ය; සහ

(viii) යෝජිත මාස 03 ක කාල සීමාව හෝ ඉදිරියට එළඹෙන කාල සීමාව තුළ ද්‍රව පෙට්‍රෝලියම් වායු මෙට්‍රික් ටොන් 9,000ක අලෙවිය සම්පූර්ණවීමෙන් අනතුරුව, ලාෆ්ස් ටර්මිනල්ස් ලිමිටඩ් විසින් මුදල් පනතේ - 2019 අංක 01 දරන වාණිජ කේන්ද්‍රස්ථාන නියෝගවල සියලු විධිවිධානවලට අනුකූල විය යුතු ය.

EOG 11 - 0173

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.